# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1684/54 - 2010 දෙසැම්බර් 18 වැනි සෙනසුරාදා - 2010.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.–බී 1/2009

**1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනත**

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 10 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (6) වැනි ඡේදය සමග කියවිය යුතු 62 වැනි වගන්තිය යටතේ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ජොන්ස්ටන් ප්‍රනාන්දු,
සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2010 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ,
සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මේ නියෝග "2010 අංක 1 දරන වී අලෙවි මණ්ඩලය නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. වී හා සහල් පැහීමේ, කෙටීමේ හෝ සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට පනතේ 10 වැනි වගන්තිය යටතේ වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'අ' ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය.

3. වී සහ සහල් පැහීමේ, කෙටීමේ හෝ සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට 10 වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'ආ' ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු අතර එවැනි සෑම බලපත්‍රයක් ම එහි නිශ්චිතව දක්වන ලද කොන්දේසිවලට යටත් විය යුතු ය.

4. (අ) මේ නියෝග යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව වී පාහින හෝ කොටන යන්ත්‍රයෙහි වී පැහීමේ හෝ කෙටීමේ ධාරිතාව –

(i) පැයකට මෙට්‍රික් ටොන් එකක් නොඉක්මවන්නේ නම් එක් එක් වර්ෂය සඳහා රුපියල් පන්සියයක් විය යුතු ය;

(ii) පැයකට මෙට්‍රික් ටොන් එකක් ඉක්මවන නමුත් පැයකට මෙට්‍රික් ටොන් පහක් නොඉක්මවන්නේ නම් එක් එක් වර්ෂය සඳහා රුපියල් දාහක් විය යුතු ය;


1A - G 013951- 380 (2010/12)

(iii) පැයකට මෙට්‍රික් ටොන් පහක් ඉක්මවන නමුත් පැයකට මෙට්‍රික් ටොන් දහයක් නොඉක්මවන්නේ නම් එක් එක් වර්ෂය සඳහා රුපියල් දෙදහස් පන්සියයක් විය යුතු ය;

(iv) පැයකට මෙට්‍රික් ටොන් දහයක් ඉක්මවන නමුත් පැයකට මෙට්‍රික් ටොන් පහළොවක් නොඉක්මවන්නේ නම් එක් එක් වර්ෂය සඳහා රුපියල් පන්දහසක් විය යුතු ය;

(v) පැයකට මෙට්‍රික් ටොන් පහළොවක් ඉක්මවන නමුත් පැයකට මෙට්‍රික් ටොන් විස්සක් නොඉක්මවන්නේ නම් එක් එක් වර්ෂය සඳහා රුපියල් අටදහසක් විය යුතු ය;

(vi) පැයකට මෙට්‍රික් ටොන් විස්සක් ඉක්මවයි නම් එක් එක් වර්ෂය සඳහා රුපියල් දොළොස් දහසක් විය යුතු ය;

*(ආ)* සෑම බලපත්‍රයක් ම කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස බලපත්‍රය නිකුත් කරන ලද දිනයේ සිට එක් අවුරුද්දක කාලසීමාවකට වලංගු විය යුතු ය.

*(ඇ)* බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි උපලේඛනයේ 'අ' ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු අතර පවත්නා බලපත්‍රය අවසන්වීමට එක් මසකට කලින් ඉදිරිපත් කළ යුතු ය.

*(ඈ)* බලපත්‍රයක් සඳහා හෝ එය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සමග නියමිත ගාස්තුව මණ්ඩලය වෙත ගෙවා ඇත්නම් මිස කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

5. වී හා සහල් පෑහීමේ, කෙටීමේ හෝ සකස් කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම එක් එක් මාසයේ දහ වැනි දින හෝ ඊට පෙර, ඊට පෙරාතුව ම වූ මාසය සම්බන්ධයෙන් වාර්තාවක් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ඉදිරිපත් කළ යුතු ය.

6. *(අ)* පනතේ 4(6)*(අ)* වැනි වගන්තිය යටතේ වී මිළයට ගැනීම සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ සෑම බලයලත් ගැනුම්කරුවකු විසින් ම එක් එක් මාසයේ දහ වැනි දින හෝ ඊට පෙර, ඊට පෙරාතුව ම වූ මාසය සම්බන්ධයෙන් වාර්තාවක් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ආකාරයට ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* පනතේ 4(6)*(ආ)* වැනි වගන්තිය යටතේ, වී හා සහල් විකිණීමට, සැපයීමට, ප්‍රවාහනය කිරීමට, බෙදා හැරීමට හෝ වී හා සහල් පෑහීමේ, කෙටීමේ හෝ සකස් කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යාමට, මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ සෑම බලයලත් ගැනුම්කරුවකු විසින් ම එක් එක් මාසයේ දහවන දින හෝ ඊට පෙර, පෙරාතුවම වූ මාසය සම්බන්ධයෙන් වාර්තාවක් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ඉදිරිපත් කළ යුතු ය.

7. බලපත්‍රයේ නිශ්චිතව සඳහන් වී තිබෙන වී සහ සහල් කොටා පාහින මෝලක් හෝ වී කොටන යන්ත්‍රයක් හෝ ගබඩාවක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් වෙත හෝ පැමිණ ඒවා පරීක්ෂා කිරීමට මණ්ඩලයේ සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද (මෙහි මින් මතු "බලය ලත් නිලධරයා" යනුවෙන් හඳුන්වනු ලබන) යම් නිලධරයකුට සෑම බලපත්‍රලාභියෙකු විසින් ම සියලු සාධාරණ වේලාවල දී අවසර දිය යුතු අතර, ඒ ව්‍යාපාරයට අදාළ වාර්තා, රෙජිස්ටර්, ගිණුම් පොත් සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමටත්, අවශ්‍ය වන්නේ නම් අවශ්‍යවන ආකාරයට ඒවායින් පිටපත් හෝ සටහන් ගැනීමටත් එම බලය ලත් නිළධාරියාට අවසර දිය යුතු ය.

8. බලපත්‍රයේ නිශ්චිතව සඳහන් වී තිබෙන, වී සහ සහල් කොටා පාහින හෝ වී සකස් කරන හෝ විකිණීම, සැපයීම, ප්‍රවාහනය හෝ බෙදා හැරීම සඳහා වී හෝ සහල් ගබඩාකර තිබෙන යම් පරිශ්‍රයකට ඇතුළු වී පරික්ෂා කිරීමට යම් බලය ලත් නිලධරයකුට සෑම බලය ලත් ගැනුම්කරුවකු විසින් ම සියලු සාධාරණ වේලාවල දී අවසරදිය යුතු අතර, ව්‍යාපාරයට අදාළ වාර්තා, රෙජිස්ටර්, ගිණුම් පොත් සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමටත්, අවශ්‍ය වන්නේ නම් අවශ්‍යවන ආකාරයට ඒවායින් පිටපත් හෝ සටහන් ගැනීමටත් එම බලය ලත් නිළධාරියාට අවසර දිය යුතු ය.

9. මේ නියෝගවල –

"පනත" යන්නෙන් 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනත අදහස් වේ; සහ

"මණ්ඩලය" යන්නෙන් 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද වී අලෙවි මණ්ඩලය අදහස් වේ.

10. 1972 ජනවාරි මස 14 වැනි දින අංක 14,992/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1971 අංක 1 දරන වී අලෙවි මණ්ඩල නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

උපලේඛනය

*(2 වැනි සහ 4 වැනි නියෝග)*

***'අ' ආකෘති පත්‍රය***

ඉල්ලුම් පත්‍ර ආකෘතිය

***1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 10 වැනි වගන්තියේ විධිවිධාන යටතේ වී සහ සහල්, කෙටීමේ, පැහීමේ හෝ සකස් කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස/බලපත්‍රය අලුත් කිරීම පිණිස වූ ඉල්ලුම් පත්‍රය***

1. අයදුම්කරු පිළිබඳ විස්තර :

(අ) සම්පූර්ණ නම :..........................................................................................................................
(මෙහි පහත 1 *වැනි සටහන බලන්න.)
ලිපිනය (පැහැදිලි අකුරෙන්) :..........................................................................................................

(ආ) පුරවැසිභාවයේ ස්වභාවය :
(i) (අ) පරම්පරාවෙන් :..........................................................................................................
(ආ) ලියාපදිංචියෙන් :..........................................................................................................

(ii) අයදුම්කරු මෙහි පහත 1[1] වැනි සටහනෙහි දක්වා ඇති යම් වර්ගයකට අයත් වේ නම්, අයදුම්කාර මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, නැතහොත්, (සේවා නියුක්තිකයන් හැර) කවරාකාරයක හෝ යම් හිමිකම් සම්බන්ධතාවක් ඇති අයකුවන සෑම තැනැත්තකු ම සම්බන්ධයෙන් පුරවැසි භාවයේ ස්වභාවය :

(අ) පරම්පරාවෙන් :..........................................................................................................
(ආ) ලියාපදිංචියෙන් :..........................................................................................................
ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ. (එබඳු සෑම තැනැත්තෙකුගේ ම සම්පූර්ණ නම හා ලිපිනය, ලියාපදිංචි අංකයත් සඳහන් කරන්න.)

(ඇ) (ආ) (ii) ඡේදයෙහි සඳහන් යම් වර්ගයකට අයත් වන යම් තැනැත්තකු ලංකාවේ පුරවැසියකු නොවේ නම් එවැනි සෑම තැනැත්තකු ම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සපයන්න :-
(අ) සම්පූර්ණ නම :..........................................................................................................
(ආ) ජාතිකත්වය :..........................................................................................................
(ඇ) ස්ථිර ලිපිනය :..........................................................................................................
(ඈ) අයදුම්කාර මණ්ඩලය කෙරෙහි ඔහුට ඇති සම්බන්ධතාවයේ ස්වභාවය :..........................................................

(ඈ) සංස්ථා ගතකර තිබේ නම් ඒ කෙසේ ද? :..........................................................................................................
(අයදුම්කරු සංස්ථා ගතකර ඇත්තේ නීතියේ කවර විධිවිධාන යටතේදැයි සඳහන් කරන්න.)

(ඉ) සංස්ථා ගත කිරීමේ සහතිකයේ අංකය :......................................... සංස්ථාගත කළ දිනය :.............................................
(සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපතක් මීට අමුණන්න.)

(ඊ) ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය :..........................................................................................................

(උ) ව්‍යාපාර නාමය :..........................................................................................................

[1] අයදුම්කරු සංස්ථාපිත මණ්ඩලයේ නම්, එහි සම්පූර්ණ නම ලියන්න. හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් හෝ වන කල්හි, සෑම හවුල්කරුවෙකුගේ ම සහ සංස්ථාගත නොකළ එම පුද්ගල මණ්ඩලයේ කවර හෝ ස්වභාවයක හෝ යම් හිමිකම් සම්බන්ධතාවක් ඇති සෑම තැනත්තකුගේ ම සම්පූර්ණ නම සඳහන් කළ යුතු ය.

(ඍ) ව්‍යාපාර නාම ආඥාපනත යටතේ ලියාපදිංචිකර තිබේ ද යන වග :

(අ) ඔව්

(ආ) නැත

(එ) ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිකුත් කරන ලද සහතිකයේ ලියාපදිංචි අංකය :

(1) ..........

(2) ..........

2. යන්ත්‍ර සහ උපකරණ පිළිබඳව විස්තර :

(අ) වී කොටන යන්ත්‍රය හෝ කොටා පාහින මෝල පිහිටු වූ දිනය :..........

(ආ) ව්‍යාපාරයක් අරඹා ඇත්නම් එය ඇරඹූ දිනය :..........

(ඇ) වෙනත් විස්තර (මීට අමුණා ඇති 'අ' ඇමුණුම පුරවන්න.) :..........

3. කළ හැකි වැඩ ප්‍රමාණය හා ඊට සම්බන්ධ වෙනත් කරුණු :

(අ) කොටා පැහීමේ / කෙටීමේ ස්වභාවය :

(i) තැම්බූ :..........

(ii) කැකුළු :..........

(iii) දෙවර්ගය ම :..........

(ආ) දිනකට එක් වැඩ මුරයකට වැඩියෙන් ක්‍රියා කරවිය හැකි ද යන වග ; එසේ කළ හැකි නම් නිමවුමේ ප්‍රමාණය :

(i) තැම්බූ (කිලෝ ග්‍රෑම් ප්‍රමාණය) :..........

(ii) කැකුළු (කිලෝ ග්‍රෑම් ප්‍රමාණය) :..........

(ඇ) (i) ආණ්ඩුවෙන් සලාකයක් ලැබේ ද යන වග :..........

(ii) ලැබේ නම්, ආණ්ඩුව සතියකට නිකුත් කරන සලාකය කොපමණදැයි සඳහන් කරන්න :..........

(ඈ) ඉකුත් වර්ෂයේ ජනවාරි මස 1 වැනි දිනෙන් ඇරඹී දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ කාලසීමාව තුළ දී අයදුම්කරු ද ඇතුළුව පෞද්ගලික පාර්ශ්වයන් සඳහා කොටන ලද/පාහින ලද, වී ප්‍රමාණය :..........

4. ඉඩම සහ ගොඩනැගිලි පිළිබඳ විස්තර (වී කොටන යන්ත්‍රය / මෝල පිහිටුවා ඇත්තේ ද යන වග) :

(අ) ඉඩමේ නම :..........

පිහිටීම :..........

(කරුණාකර දිස්ත්‍රික්කයේ හා නගරයේ / ගමේ නම සඳහන් කරන්න.)

ඉඩමේ ප්‍රමාණය :..........

(ආ) ඉඩමේ / පරිශ්‍රයේ තක්සේරු අංකය / අංක :..........

(ඇ) ඉඩම සම්බන්ධයෙන් අයදුම්කරුට තිබෙන හිමිකමේ ස්වභාවය :..........

(ඈ) ගොඩනැගිලි හා ඉදිකිරීම් පිළිබඳ විස්තර :..........

(මීට අමුණා ඇති 'ආ' ඇමුණුම ද පුරවන්න)

***සැළකිය යුතුයි.***- අයදුම්කරු සංස්ථාපිත මණ්ඩලයක් නම් කරුණාකර එහි සම්පූර්ණ නම ලියන්න. හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් නම් පුද්ගල මණ්ඩලයේ නම් සඳහන් කරන්න.

5. වරිපනම් විස්තර :

(i) යම් පළාත් පාලන ආයතනයකට වරිපනම් / බදු ගෙවනු ලැබේ නම්, එහි නම :..........

(ii) කාර්තුවකට ගෙවන මුදල :..........

(iii) වාර්ෂික තක්සේරුව :..........

(iv) ව්‍යාපාරය කරගෙන යාම වෙනුවෙන් පළාත් පාලන ආයතනයකට බලපත්‍ර ගාස්තුවක් / ලියාපදිංචිවීමේ ගාස්තුවක් ගෙවනු ලැබේ නම්, එම ගාස්තු ප්‍රමාණය :..........

(v) දැනට බලපත්‍රයක් තිබේ නම් එය අවසන්වන දිනය :..........

6. විස්තර විවිධ කරුණු :

(අ) *ගින්නෙන් අනතුරු පිළිබඳ අවධානම්.-* ගින්නෙන් ආරක්ෂාවීමට විධිවිධාන යොදා තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :......................................................................................................

(ආ) *රක්ෂණය.-* ගින්නෙන් හෝ වෙනත් ආකාරවලින් හෝ සිදුවිය හැකි අනතුරු සම්බන්ධයෙන් රක්ෂණය කර තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :......................................................................................................

මගේ / අපගේ දැනුම අනුව, ඉහත සඳහන් විස්තර සත්‍ය බව හා නිවැරදි බව ...................................... වන මම/අපි මෙයින් සහතික කරමි/කරමු. ඉහත සඳහන් විස්තර කිසිවක් වැරදි බැව් අනාවරණය වුවහොත්, මට/අපට නිකුත් කරනු ලබන බලපත්‍රය අවලංගු කිරීමට වී අලෙවි මණ්ඩලයට බලය ඇති බව මම / අපි දනිමි / දනිමු.

....................................................

දිනය :................................ අයදුම්කරුගේ අත්සන.

සටහන.- මෙම පෝර්මය පිරවීමේ දී නොගැලපෙන වචන කපා දමන්න.

'අ' ඇමුණුම

*යන්ත්‍ර සහ උපකරණ*

| *විස්තරය* | *(අදාළ අවස්ථාවන්හි දී) ඒකක ගණන, ප්‍රමාණය සහ ධාරිතාව* | *වෙසෙසුම, වර්ගය, ස්වභාවය යනාදිය* | *ආයු කාලය* | *වෙනත් කිව යුතු කරුණු* |
|---|---|---|---|---|
| (1) වී තැම්බීමේ උපකරණ :<br>(අ) සිසිල් දියේ පොඟවන ටැංකි<br>(ආ) උණු දියේ පොඟවන ටැංකි හා වී තම්බන ටැංකි<br>(ඇ) වාෂ්ප බොයිලේරු<br>(ඈ) වේලන බිම - මුළු වර්ග ප්‍රමාණය<br>(ඉ) වතුර ටැංකි<br>(ඊ) වතුර ලබා ගන්නා මාර්ගය<br>(උ) කෘත්‍රිම වියළනයන්<br>(ඌ) වී තැම්බීමේ වෙනත් උපකරණ<br>(ඔ) (අ) සිට (උ) දක්වා වූ වර්ගවලට නොවැටෙන වෙනත් උපකරණ ඇතොත් ඒවා<br><br>(2) වී කෙටීමේ උපකරණ :<br>(අ) වී පොලන යන්ත්‍ර<br>(ආ) කොටන යන්ත්‍ර<br>(ඇ) වෙන් කරන යන්ත්‍ර<br>(ඈ) පාහින යන්ත්‍ර<br>(ඉ) හාල් වර්ග කිරීමේ යන්ත්‍ර<br>(ඊ) වෙනත් යන්ත්‍ර, උත්ථාපක, වාහක යනාදිය<br><br>(3) විදුලි ස්ථාපනය<br><br>(4) ප්‍රධාන ප්‍රේරකය (ප්‍රයිම් මූවරය) සහ අශ්ව බල ගණන ආදී විස්තර | | | | |

| *විස්තරය* | *(අදාළ අවස්ථාවන්හි දී) ඒකක ගණන, ප්‍රමාණය සහ ධාරිතාව* | *වෙහෙසුම, වර්ගය, ස්වභාවය යනාදිය* | *ආයු කාලය* | *වෙනත් කිව යුතු කරුණු* |
|---|---|---|---|---|
| (5) කසළ අපවහන පහසුකම් | | | | |
| (6) මෙම ඇමුණුමේ (1) (2) (3) (4) සහ (5) යටතේ නොවැටුණු යන්ත්‍රෝපකරණ සහ උපකරණ වෙතොත් ඒවා | | | | |

'ආ' ඇමුණුම

*ගොඩනැගිලි සහ ඉදි කිරීම්*

| *විස්තරය* | *අදාළ අවස්ථාවන්හි දී වර්ග ප්‍රමාණය හෝ ප්‍රමාණය* | *වෙසෙසුම් හා ඉදිකිරීම්* | *අදාළ අවස්ථාවන්හි දී ධාරිතාව මෙට්‍රික් ටොන් වලින්* | *ආයු කාලය* | *වෙනත් කිව යුතු කරුණු* |
|---|---|---|---|---|---|
| 1. වී ගබඩා කිරීම සඳහා | | | | | |
| 2. හාල් ගබඩා කිරීම සඳහා | | | | | |
| 3. හාල් කොටා පැහීම සඳහා | | | | | |
| 4. වෙනත් ප්‍රයෝජන සඳහා (**නිදසුන** : කාර්යාල යනාදිය) | | | | | |

'ආ' ආකෘතිය

*(3 වැනි නියෝගය)*

***1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 10 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය***

1. බලපත්‍රලාභියාගේ නම :.................................................................
2. බලපත්‍රලාභියාගේ ලිපිනය :.................................................................
3. ව්‍යාපාරයේ නම සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය :.................................................................
4. කොටන යන්ත්‍රයේ / මෝලේ ධාරිතාව :.................................................................
5. බලපත්‍රය වලංගු කාල සීමාව :

   (අ) ආරම්භවන දිනය :.................................................................
   (ආ) අවසන්වන දිනය :.................................................................

ඉහත කී ව්‍යාපාර ස්ථානයේ දී වී හා සහල් කෙටීමේ, පැහීමේ නැතහොත් සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා වී අලෙවි මණ්ඩලය විසින් ඉහත නම් සඳහන් බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කරන ලද ................................ දින දරන ඉල්ලුම්පත්‍රය සලකා බැලීමෙන් පසුව මෙම බලපත්‍රය එම බලපත්‍රලාභියා වෙත නිකුත් කරන ලද අතර, මෙහි නිශ්චිත කොන්දේසිවලට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

වී අලෙවි මණ්ඩලයේ බලය පිට නිකුත් කරන ලදී.

...............................................

බලපත්‍රදායක නිලධාරියා.

දිනය :...............................

කොළඹ 02.

අංක 330, යූනියන් පෙදෙස,

වී අලෙවි මණ්ඩලයේ දී ය.

ඉහත කී කොන්දේසි මෙසේය.-

1. බලපත්‍රලාභියාගේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ යම්කිසි ප්‍රකට ස්ථානයක මෙම බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු ය.

2. වී සහ සහල් කෙටීමේ, පෑහීමේ සහ සකස් කිරීමේ තම ව්‍යාපාරය කරගෙන යාම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් බලයලත් නිලධාරියෙකු විසින් විටින්විට තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි සියලු ම උපදෙස් බලපත්‍රලාභියා විසින් නොපමාව ක්‍රියාත්මක කළ යුතු ය. වී පාහින ආකාරය හා ඊට ආනුශංගිකව පවත්නා කරුණු සම්බන්ධයෙනුත් තමාගේ වී කොටන යන්ත්‍රයේ හෝ මෝලේ කිසියම් කොටසක් හෝ කොටස් ප්‍රතිසම්පාදනය නැතහොත් අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙනුත් දිය හැකි උපදෙස් ද වෙනත් කරුණු අතර ඉහත කී උපදෙස්වලට ඇතුළත් වේ.

3. බලපත්‍රලාභියා තමාගේ ව්‍යාපාරය පිළිබඳ නිසි වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත් තබාගත යුතු අතර, මණ්ඩලයේ යම් බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා සියලුම සාධාරණ වේලාවන්හි දී ඒවා ඉදිරිපත් කළ යුතු ය. තව ද අවශ්‍ය වන්නේ නම් අවශ්‍ය වන ආකාරයට ඔහුට ඒවායේ පිටපත් හෝ සටහන් ගැනීමට ඉඩ දිය යුතු ය.

4. මෙහි 3 වැනි ඡේදයේ සඳහන්කර ඇති වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත්වලට අමතරව, මණ්ඩලයේ යම් බලයලත් නිලධාරියෙකු විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි තවදුරටත් වූ හා අනෙකුත් වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත් ද බලපත්‍රලාභියා විසින් පවත්වාගත යුතු අතර, මණ්ඩලයේ බලයලත් යම් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා සියලු ම සාධාරණ වේලාවන්හි දී එකී තවදුරටත් වූ හා අනෙකුත් වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත් ඉදිරිපත් කළ යුතු ය. තව ද, අවශ්‍ය වන්නේ නම් අවශ්‍යවන ආකාරයට ඔහුට ඒවායේ පිටපත් හෝ සටහන් ගැනීමට ඉඩදිය යුතු ය.

5. මෙම බලපත්‍රය නිකුත්කර තිබෙන්නේ යම් ව්‍යාපාර ස්ථානයක් කරගෙන යාමට ද එහි වී හා සහල් කෙටීම, පෑහීම හෝ සකස් කිරීම පිළිබඳ නිසි වාර්තා හා සංඛ්‍යාලේඛන මණ්ඩලයේ යම් බලපත්‍රයක් නිලධාරියකු විසින් විටින්විට නියම කරනු ලැබිය හැකි කාල පරතරයන්ට අනුව, බලපත්‍රලාභියා විසින් සැපයිය යුතු ය.

6. මණ්ඩලයේ බලයලත් යම් නිලධාරියෙකුට, ස්වකීය ව්‍යාපාරයේ කාර්යයන් සඳහා පාවිච්චි කරන යම් ගබඩාවක්, ගුදමක්, කාර්යාලයක් හෝ වෙනත් යම් ගොඩනැගිල්ලක් ද ඇතුළුව තමාගේ කොටන යන්ත්‍රය/මෝල ස්ථාපනයකර ඇති පරිශ්‍රයට සියලු ම සාධාරණ වේලාවන්හි දී ඇතුළත් වී ඒවා හෝ ඒවායේ යම් කොටසක් පරීක්ෂා කිරීමට බලපත්‍රලාභියා අවසර දිය යුතු අතර, ඒවාට අදාළ පොත් පත්, ලේඛන හෝ ඒවායෙන් එකක් හෝ වැඩි ගණනක් පිළිබඳව හෝ එම පරිශ්‍රය තුළ තිබියහැකි වී හෝ සහල් පිළිබඳ හෝ අවශ්‍ය විය හැකි සියලු ම තොරතුරු සැපයීම හෝ සිය ව්‍යාපාර ස්ථානයෙහි තිබිය හැකි වී හෝ සහල් ඔහුට භාරදීම හෝ පරීක්ෂා කිරීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කිරීම කළ යුතු ය.

7. සිය ව්‍යාපාරය කරගෙන යාම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරක් බලපත්‍රලාභියා විසින් මණ්ඩලය වෙත සැපයිය යුතු ය.

8. ඉහත කී ඉල්ලුම්පත්‍ර ආකෘතියෙහි තමා විසින් සපයා තිබිය හැකි කිසියම් කරුණක් හෝ කරුණු පිළිබඳව නැතහොත් එබඳු කරුණක් හෝ කරුණුවල කිසියම් කොටසක් පිළිබඳ කිසියම් වෙනසක් කිරීමක් අවශ්‍ය වේ නම් බලපත්‍රලාභියා ඒ බව මණ්ඩලය වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතු ය.

9. මෙම බලපත්‍රය බලපත්‍රලාභියාටම පෞද්ගලිකවූවක් වන අතර, නිකුත් කරනු ලැබුවේ යම් ව්‍යාපාරයක් කරගෙන යාමට ද ඒ ව්‍යාපාරය මණ්ඩලයේ ලිඛිත අනුමැතිය නොමැතිව පැවරීම, බැඳ තැබීම හෝ ඒ සම්බන්ධයෙන් අන් ලෙසකින් ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

10. කෙටීම, පෑහීම හෝ සකස් කිරීම සඳහා කවර හෝ යම් තැනැත්තකු විසින් බලපත්‍රලාභියා වෙත වරින්වර සපයනු ලැබිය හැකි මුළු වී ප්‍රමාණය හෝ එයින් සකස් කරගනු ලබන මුළු සහල් ප්‍රමාණය එම තැනැත්තාට නිසි පරිදි ආපසු බාරදෙන තෙක්, බලපත්‍රලාභියාගේ ව්‍යාපාර කාර්යය සඳහා පිහිටුවා ඇති ගබඩාවල හෝ ගුදම්වල අඛණ්ඩව ගබඩාකර තැබිය යුතු ය.

11. මණ්ඩලය විසින් බලපත්‍රලාභියා වෙත වී සපයනු ලබන බවට ප්‍රතිඥාවක් මණ්ඩලය විසින් දෙනු නොලැබේ.

12. තමාට අයිති වී කොටවා ගැනීමට, පාහා ගැනීමට හෝ සකස්කරවා ගැනීමට බලපත්‍රලාභියා අදහස් කරන්නේ නම් කලින් සඳහන් කළ ව්‍යාපාර ස්ථානයේ දී එය කොටවා ගැනීමට, පාහා ගැනීමට හෝ සකස් කරවා ගැනීමට ඔහුට අයිතිය තිබිය යුතු අතර එසේ කරන විට ඒ පිළිබඳව නිසි සටහන් තම ව්‍යාපාරයේ වාර්තාවල, රෙජිස්ටරවල හා ගිණුම් පොත්වල ඇතුළත් කළ යුතු ය.

12-1165

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.